සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(I)**

**කාලය: පැය 03**

**පරිපාලනය - 02-IV**

විභාග අංකය
Index No / சுட்டெண்
.......................................

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. I. සේවා ව්‍යවස්ථාවක් සහ බඳවා ගැනීමේ පටිපාටියක් අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පමණක්ම පත් කිරීම් සිදු කළ යුතු නිලධාරී ගණයන් මොනවාද? (ලකුණු 05)

III. බඳවා ගැනීමේ පටිපාටියක අඩංගු විය යුතු අනිවාර්ය කරුණු පහක් (05) දක්වන්න. (ලකුණු 05)

IV. රජයේ සේවයට පත් කරනු ලැබීමට සුදුසුකම් නොලබන තැනැත්තන් පහක් (05) දක්වන්න. (ලකුණු 05)

02. I. රජයේ නිලධරයකුගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය වන කරුණු පහක් (05) දක්වන්න. (ලකුණු 03)

II. රාජ්‍ය නිලධරයකු කාර්යක්ෂමතා කඩඉමෙහි අවශ්‍යතා සැපිරිය යුත්තේ ඇයි? (ලකුණු 03)

III. රජයේ නිලධරයකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදාහැරීමේ දී භාවිත කරන පරිශිෂ්ටයන් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 04)

IV. නියමිත කාල සීමාව තුළදී කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති නිලධරයකු සම්බන්ධයෙන් පරිපාලන බලධාරියා/ පත් කිරීම් බලධරයා ක්‍රියා කළ යුත්තේ කෙසේද? (ලකුණු 10)

03. I. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් නොලබන රජයේ නිලධරයන් කාණ්ඩ පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

II. රජයේ නිලධරයෙකු ස්ථාන මාරු කිරීමේ අරමුණු මොනවා ද? (ලකුණු 05)

III. මාරු මණ්ඩලයක් මගින් නොකළ යුතු ස්ථාන මාරු කිරීම් කවරේ ද? (ලකුණු 10)

04. ආයතන සංග්‍රහයට අනුව වැටුප් වර්ධකය අයිතිවාසිකමක් නොව උපයා ගත යුත්තකි.

I. යම් නිලධරයෙකු වැටුප් වර්ධකයක් ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා මොනවාද ? (ලකුණු 04)

II. වැටුප් වර්ධකය උපයා නොගත් අවස්ථාවක දී එම වැටුප් වර්ධක ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලබන ක්‍රම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 16)

05. I. යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමේ අරමුණ කුමක්ද ? (ලකුණු 05)

II. යම් නිලධරයකුට විරුද්ධව සකස් කෙරෙන චෝදනා පත්‍රයක අඩංගු විය යුතු කරුණු මොනවාද? (ලකුණු 10)

III. විධිමත් විනය පරීක්ෂණයක දී සම්බන්ධ වන පාර්ශවයන් / නිලධරයන් නම් කරන්න. (ලකුණු 05)

06. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

I. පරිවාස කාලය

II. සංයුක්ත දීමනාව

III. අතිකාල දීමනා

(ලකුණු 10x2=20)

***********